**උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය - 2018**

**----------------------------------------------------------------------------------------------------**

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව අතර 2017 ජුලි 17 දින එළඹි අංක 8743 එල්කේ ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගෙ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, සියළුම විශ්වවිද්‍යාල 15 ක් සහ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. හඳුනාගත් ප්‍රමුඛ විෂයයන්ට ඇතුළත්වීම් වැඩි කිරීම, උපාධි වැඩසටහන්වල ගුණත්වය වැඩි දියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛ විෂයන්ට ඇතුළත්වීම් වැඩි කිරීම, උසස් අධ්‍යාපනයේ ගුණත්වය වැඩිදියුණු කිරීම, පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන දිරි ගැන්වීම සහ මෙහෙයුම් සහ නියාමන සහය යන සංරචක යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය සහ මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,500 කට සමාන එජඩො මිලියන 100 ක් වූ අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සහ ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජුනි 3 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. භෞතික කාර්යසාධනය

2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

2018 දෙසැම්බර් 31 දිනට

| සංවරකය | | ක්‍රියාකාරකම | අපේක්ෂිත භෞතික කාර්යසාධන ඒකකය | අත්කර ගත් කාර්යසාධන ඒකකය | ප්‍රමාදය | බලපෑම | ප්‍රමාදයන්ට හේතු |
|---|---|---|---|---|---|---|---|
| උසස් අධ්‍යාපනයේ ගුණත්වය වැඩිදියුණු කිරීම | (අ) | වැඩිදියුණු කිරීමල ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රිසි භාෂාව කුසලතාවයන් වැඩිදියුණු කිරීම. | පළමු වටය යටතේ විශ්ව විද්‍යාලවල පීය 10 කට ප්‍රදානයන් පිරිනැමීමට අපේක්ෂා කෙරේ. | ප්‍රදානයන් නිකුත් කර නැත. | මාස 12 | ව්‍යාපෘතියේ කාලය දීර්ඝ වීමට ඉඩ ඇත. | මාර්ගෝපදේශයන් සංවර්ධනය සහ යෝජනා සමාලෝචන යන මූලික කටයුතු අවසන් කිරීම සඳහා කාලය ගතවීම. |
| | (ආ) | අධ්‍යානය කාර්ය මණ්ඩලය සඳහා පශ්චාත් උපාධි පාඨමාලා | 2018-2020 වර්ෂවලදී අවම වශයෙන් විද්වතුන් 200 දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනැමීම. | කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 14 දෙනෙකුට පමණක් ශිෂ්‍යත්ව ප්‍රදානය කර තිබුණි. | - | අපේක්ෂිත අරමුණු ලගාකරගත නොහැකි වේ. | 2018 වර්ෂයේදී දෙවතාවක් අයදුම්පත් කැඳවා තිබුණි. තෝරාගත් අයදුම්කරුවන්ට අධ්‍යාන කටයුතු ආරම්භ කිරීමට මාස 6 ක කාලපරිච්ඡේදයක් ලබාදී තිබුණි. |

**කළමනාකරණය අදහස් දැක්වීම** අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අත්‍යාවශය ක්‍රියාවලියකට අනුගතවීමට සිදුවීම හේතුවෙන් 2018 දී මූල්‍ය සහයන් නිකුත් කිරීමට නොහැකි විය.

**විගණකගේ නිර්දේශය** කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| විය පැහැදම් සම්බන්ධ ප්‍රතිඵලවල කාර්ය සාධනය සනාථ කිරීමට ස්වාධීන තුන්වන පාර්ශවයක් පත් | තෙවන පාර්ශ්වයකගේ සහතික කිරීමකින් තොරව ලෝක බැංකුව ණය වාරික නිදහස් නොකරනු ඇත. | ඊළඟ වර්ෂයේදී කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පියවර ගනු ලැබේ. | ව්‍යාපෘති මෙහෙයුම් අත් පොතට අනුව, ස්වාධීන තුන්වන පාර්ශ්වයක් පත් කිරීමට පියවර ගත යුතුය. |

කර නොතිබුණි.

## 2.3 වැඩබිම් පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී විද්‍යා තාක්ෂණික, ඉංජිනේරු සහ ගණිත ක්ෂේත්‍රවල උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා ජාතික විශ්ව විද්‍යාල 16 ක පීඨ සඳහා උපකරණ මිලදී ගැනීමට එකතුව රු.මිලියන 528.10 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් රු.මිලියන 57.29 ක පිරිවැයකට මිලදීගත් උපකරණ අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනයකින් තොරව කැළණිය විශ්ව විද්‍යාලය, අග්නිදිග විශ්ව විද්‍යාලය සහ රුහුණු විශ්ව විද්‍යාලවල මාස 05 ඉක්මවා නිෂ්කාර්යව පැවතුණි. තවද, කොළඹ විශ්වවිද්‍යාලයට, නැගෙනහිර විශ්වවිද්‍යාලයට සහ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලට ප්‍රේෂණය කරන ලද රු.මිලියන 86.10 ප්‍රදානයන් උපයෝජනය පිළිබඳව භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා වී නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ලඟාකර ගත නොහැකි වේ. | මෙම ගැටළුව හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට කඩිනම් පියවර ගනු ලැබේ. | අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

## 2.4 ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණන නිරීක්ෂණ |
|---|---|---|---|---|
| (අ) | ණය නියෝජිතායතනය විසින් ප්‍රේෂණය කරන ලද රු.මිලියන 7,803.05 ක ණය මුදලින් 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 7,765.89 ක් පමණක් උපයෝජනය කර තිබුණි. රු.මිලියන 37.16 ක ඉතිරි | මන්දගාමී වියපැහැදම් කිරීම හේතුවෙන් රු.මිලියන 31.86 ක බැඳීම් ගාස්තු ගෙවීමට සිදුවේ. | බැඳීම් ගාස්තු අදාල වන්නේ ණය මුදලේ වියපැහැදම් නොකළ ශේෂය සඳහා වන අතර 2018 ව්‍යාපෘතියේ පළමු අවුරුද්ද බැවින් | ප්‍රමාද වූ කටයුතු ලගා කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන විශේෂ (ඩොලර්) ගිණුමේ වියදම් නොවී පැවතුණ අතර රු.මිලියන 178.79 ක අනෙකුත් ශේෂය 2018 දෙසැම්බර් 31 දිනට මාස 04 තිස්සේ ව්‍යාපෘතියේ ජංගම ගිණුමේ පැවතුණි. | | වියපැහැදම් කිරීම් සාපේක්ෂව අඩු විය. | |
| (ආ) | ව්‍යාපෘතිය අත්තිකාරම් මුදල් රු.මිලියන 847.10 ක් ජාතික විශ්ව විද්‍යාල 15 කට ප්‍රේෂණය කර තිබුණද, ඉන් 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 287.69 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඉතිරි රු.මිලියන 559.41 ක මුදල එම විශ්ව විද්‍යාලවල බැංකු ජංගම ගිණුම්වල 2018 දෙසැම්බර් 31 දින වන විට මාස 04 ක් තිස්සේ වියදම් නොකර පැවතුණි. | ව්‍යාපෘති කාර්යාලය එහි කටයුතු 2018 ජුලි ආරම්භ කළ හෙයින් ප්‍රසම්පාදනයන් කඩිනම් කිරීමේ අරමුණින් විශ්ව විද්‍යාලවලට 2018 වර්ෂය සඳහා අනුමත අරමුදල් නිදහස් කිරීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි. | විශ්ව විද්‍යාල මට්ටමින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නොවැලැක්විය හැකි ප්‍රමාදයන් සහ 2018 අවසාන කාර්තුව තුළදී විනිමය අනුපාතියේ ඉහල උච්චාවචනයන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට බලපා ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපාර සම්බන්ධතා ඒකක ස්ථාපනය කිරීමට විශ්ව විද්‍යාල 05 කට එකතුව රු.මිලියන 20 ක ප්‍රදානයන් නිදහස් කර තිබුණි. | කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සිදුවීමට ඉඩ ඇත. | වර්තමානයේ විශ්ව විද්‍යාල 07 ක ව්‍යාපාර සම්බන්ධතා ඒකක දැනටමත් ස්ථාපනය කර තිබුණි. | ප්‍රමාද වූ කටයුතු ලඟා කර ගැනීමට පියවර ගත යුතුය. |